# පින්සල පැන්සල පෑන අත්නොහළ තලංගම



දේශීය සන්නිවේදන ක්ෂේත්‍රයේ චිත්‍ර කතා භාවිතය හරහා නමක් දිනා සිටින ප්‍රමුඛ පුද්ගලයකු ලෙස තලංගම ජයසිංහ මෙරට කාගේත් මතකයේ රැඳී ඇතුවාට සැක නැත. රුවින් නොහඳුනන නමුත් 'තලංගම' කියූ සැණින් 'ජයසිංහ' නාමයත් අගට එකතු වී ක්ෂණිකව 'තලන්ගම ජයසිංහ' යන නාමය මතක් වීමට තරම් ලාංකීය හදවත් තුළ ඔහු ජීවත් වෙමින් සිටී.

දිවයිනේ සමාජ අසාධාරණයට එරෙහිව සිය තෙළිතුඩෙන් නිහඬ සටනක යෙදුණු ජනතා සම්මානයට පාත්‍රවූ ප්‍රවීණ චිත්‍ර ශිල්පි තලංගම ජයසිංහ මහතා පසුගිය (07දා) රාත්‍රියේ සිය ජීවන ගමන නිමා කළේය. 1936 ජූලි මස 5 වැනිදා තලංගම බත්තරමුල්ලේදී උපත ලැබූ ඔහු මියයන විට 88 වන වියෙහි පසුවිය. ඔහු කලක් ඔත්පලව සිටි අතර මීට දින 3 කට පෙර හදිසියේ අසනීපව රෝහල් ගතකර තිබුණි. ඔහුගේ දේහය පිළිබඳ අවසන් කටයුතු අද (11දා) උදේ 11.30ට බොරැල්ල කනත්තේදී සිදුකිරීමට නියමිතය.

ඔහුගේ මුල් නම ජෝර්ජ් එඩ්මන් ජයසිංහ වූ අතර ඔහුගේ පියාවූ ජෝජ් ඇල්බට් ජයසිංහ නම් විය. ඔහුගේ දයාබර බිරිඳ ශ්‍රීමා ජයසිංහ (විවාහයට පෙර කොළඹගේ)යි. ඔවුනට දරුවන් තිදෙනකු සිටි අතර පුතුන් දෙදෙනා අසේල, අයෝමා හා දියණිය වින්දාා ය.

දේශීය සන්නිවේදන ක්ෂේත්‍රයේ චිත්‍ර කතා භාවිතය හරහා නමක් දිනා සිටින ප්‍රමුඛ පුද්ගලයකු ලෙස තලංගම ජයසිංහ මෙරට කාගේත් මතකයේ රැඳී ඇතුවාට සැක නැත. රුවින් නොහඳුනන නමුත් 'තලංගම' කියූ සැණින් 'ජයසිංහ' නාමයත් අගට එකතු වී ක්ෂණිකව 'තලන්ගම ජයසිංහ' යන නාමය මතක් වීමට තරම් ලාංකීය හදවත් තුළ ඔහු ජීවත් වෙමින් සිටී. පුවත්පත්, චිත්‍ර කතාව හා කාටූන් කලාව ජීවිතය කරගත් තලංගම ජයසිංහ වසර 19 ක් සතුට ලංකාවේ මුල්ම පුවත්පතේ කතුවරයකු ලෙස සේවාවේ දී සිටියේය. 2005 අවුරුද්ද වෙනකම් සිළුමිණ පත්‍රයට චිත්‍රකතා තිබුණි. චිත්‍රකතා 72ක් පමණ නිම කර ඇති ඔහු වසර 2008 දී ජ්‍යේෂ්ඨ පුවත්පත් කලාවේදීන්ට පිරිනමනු ලබන ජනතා සම්මානයෙන්ද සම්මාන ලද අයෙකු විය. ඔහුගේ ඇතැම් චිත්‍ර කතා සිනමා නිර්මාන සඳහා ද තෝරාගෙන තිබුණි.

බත්තරමුල්ල, පැලවත්තේ විද්‍යාවර්ධන බෞද්ධ මිශ්‍ර පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා ගෙන තිබුණු අතර කුඩා කල සිටම ළමා සඟරාවලට කවි, චිත්‍ර යැවීම කුඩා තලංගම විසින් සිදුකර තිබුණි. එම චිත්‍ර සඟරාවවල පුවපත්වල පළව තිබීම නිසා ඔහු ඊට යටින් කවි පද ලියා යැවීමටද පුරුද්දක් කර ගත්තේය.

අපොස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ඔහු රජයේ ලලිත කලා ආයතනයට (හේවුඩ්) පස් අවුරුදු පාඨමාලාවක් සඳහා 1951දී ඇතුළත් විය. එහිදී අධ්‍යාපනය ලද මුල් මාස තුන පසුවීමත් සමග තලංගමගේ දක්ෂතාව තේරුම් ගත් ගුරුවරු ඔහුට උසස්වීම් දෙකක් ලබා දුන්නේ වාර දෙකකදීම පන්තියක් පසුකර පන්තියකට යැමට ඉඩ සලසා දුන් බව ඔහු වරෙක සඳහන් කර තිබුණි.

"චිත්‍ර, මූර්ති, මැටි හා ලාකඩ කියන විෂයන් හතරම ඔහු විසින් මෙහිදී හැදෑරූ අතර, ඊට අමතරව නිවාස සැලසුම් පිළිබඳවත් ඉගෙනීමේ නිරතව සිට ඇත. ඔහුගේ නිවසත් මගේම සැලසුමට අනුවයි ගොඩනැගුණේ." මේ නිසාම බව වරක් ඔහු පිළිබඳ මුහුණු පොතෙහි සටහනක සිය වැඩිමහල්; පුතුවූ අසේල විසින් සඳහන් කර තිබුණි. ඔහු එහි දී මෙසේ තම පියාගේ වදන් කියා තිබුණේ මෙසේය" මේ එක්කම මම මරදානේ 'ටෙක්නිකල් කොලේජ්' යන්න ගත්තා වැඩිදුරටත් චිත්‍ර විෂය හදාරන්න.

හේවුඩ් එකේ ඉගෙන ගන්න ගමන් වෙළෙඳ දැන්වීම් ආයතනයක අමතර රස්සාවකට ගියේ ජීවත්වෙන්න ඉගෙන ගන්න සල්ලි ඕන නිසා. මේ වෙද්දි නංගිලා දෙන්නත් ඉගෙන ගන්නවා. එයාලගෙ ඒ කටයුතු බලන්න වුණෙත් මට. පඩිය රුපියල් 125යි. එතැනින් තව තැනකට ගියා. එතැනින් ලැබුණේ රුපියල් 150යි. මේ වගේ මම දැන්වීම් ආයතන පහක වැඩ කළා. මේ අතරේ තමයි 1956දී සිළුමිණ පත්තරේට චිත්‍ර ශිල්පියෙක් අවශ්‍යයි කියන දැන්වීම දැක්කේ. මේ වෙද්දි මගේ වයස අවුරුදු 19යි.

කොහොමහරි පත්තරයක වැඩ කරන්න තිබුණු ආසාවටම රුපියල් 250ක් වැනි වැටුපකට මම මේ රස්සාව තෝරාගත්තේ 400ක් වැනි අයදුම්කරුවන් අතරින් මාව තෝරාගෙන තිබුණු සතුටත් හිතේ ඇතිවයි.

සිය සැඳෑ සමය ගෙවන තාත්තා අදටත් පාඨක ජනතාවෙත සිය නාමය ගෙනයන්නේ ලංකාදීප පුවත් පතින් "ඒ තුමා" සහ "පලාමල්ල" යන දේශපාලන කාටූන් ද්විත්වයක් ඉදිරිපත් කරමින් යයි ඔහු එහි සඳහන් කර තිබුණි.

තලංගම ජයසිංහ තම චරිතාපදානය කෙටියෙන් ලිවීමට අපහසුය. ඔහු අතින් නිමවූ පොත කවර පිටු රැසකි. මා ලේක්හවුස් ආයතනයේ සේවය කළ සමයේ එනම් 1977 තරම් දිගු කලක අප සේවාවේ යෙදුණේ එකම ආයතනයක කතු මඬුලු දෙකකය, ඔහු නිතරම සිනාමුසු මුහුණින් සිටි ප්‍රිය මනාප අයකු විය. විටක අපි ඔහු ඇමතුවේ තලං නමිනි. ඔහු සතුට පුවත්පතේ නිතරම චිත්‍ර කතා අඳිමින් පින්සල අතට ගෙන පුටුවට බරවී බර කල්පනාවකට යෙදී නැමී සිටි හැටි මනසේ සදා රැඳී තිබේ. එහි සිටි බොහෝ දෙනකු අද අප අතර නැත. තලං මා මවුබිමට ගිය විට ද අමතන්නට මුණ ගැසෙන්නටද අමතක කළේ නැත. නිතරම ඔහුගේ මුව අග රැඳී අව්‍යාජ සිනහව සදා නොවෙනස්ව රැඳී තිබුණි. අද ඒ සිනහව වියැකී ගොසිණි.

ලන්ඩනයේ පළවූ අප පුවත්පතට ලංකා නිවුස් යූකේ ආරම්භයේ සිටම මගේ ඉල්ලීම පරිදි ඔහුගේ කාටූන් කවි පළකිරීමට කළ ඇරයුම එක හෙළාම පිළිගත්තේය. ඔහුගෙන් සිදුවූ නිහතමානී එම සේවාව අපි සදා අනුමරණීය එකක් බව කිව යුතුය. එමෙන්ම ඔහු අපේ ඉල්ලීම කෙතරම් වැඩ රාජකාරි බහුල අයකු වූවද එම සේවාව නොපිරි හෙලාම ඉටු කළේය. අපි ඔහුගේ එම සේවාව සදා සමරන්නෙමු. ඔහු මීට අලින් ලන්ඩනයේ පළවූ ලංකා විත්ති පුවත්පතටද එලෙසම ඉටුකළ බව අප මිතුරු එහි කතුවරයාවූ දයා ආනන්ද රණසිංහයන් මා සමග පැවසුවේ. අප අඩසිය වසකට ආසන්න කලක් දැන හැඳුණු ප්‍රිය මිතුරාගේ වියෝව කොතරම් දුර බැහැර සිටිය ද තදින්ම අපට දැනෙන නිසාවෙන් බව කිව යුතුය.

දේශපාලකයන් ගෙන් ඇතැමුන් ඔහුව පැසසූ අතර තවත් කොටසක් ඔහුව නොරිස්සා තිබූ බව වරෙක රූපවාහිනී වැඩසටහන කවි පැතිකඩ වැඩසටහනේදී ප්‍රකාශ කර තිබුණි.

තලං ඔබ අප රටේ සමාජ අසාධාරණයට එරෙහිව සිය තෙලි තුඩින්, කාටූන් කවියෙන් කරන ලද මෙහෙය සදා සමරනු ඇත.

ඔබට අමාමහ නිවන් සුව පතන්නෙමු - ඔබට සුබ ගමන්

**ශාන්ත සේනාධීර**
ලංකා නිවුස් යූකේ.